# පරිසරවේදියා 2025
## ගුරුවරුන් සඳහා මාර්ගෝපදේශ

### 1. වැඩ සටහනේ අරමුණ

වර්තමානයේ විභාග ඉලක්ක කරගත් අධ්‍යාපන ක්‍රමය හේතුකොටගෙන පෞද්ගලික පන්ති සඳහා දරුවන් යොමු කිරීමේ ප්‍රවණතාව ඉහළ යමින් පවතී. මේ හේතුකොටගෙන දරුවන් එළිමහන් ක්‍රියාකාරකම්වල යෙදීම හා ස්වාභාවික පරිසරය හා ගැටීමට ඇති කාලයත් බෙහෙවින් අඩු වෙමින් පවතී. එමෙන්ම, රූපවාහිනිය, පරිගණක, ජංගම දුරකථන හා අධිතාක්ෂණික මෙවලම් වලට ඇබ්බැහි වීම දරුවන් තවදුරටත් පරිසරය සමග ඇති සම්බන්ධතාව අඩුවීමට හේතු වී ඇත. මෙවැනි තත්ත්වයක් තුළ ගුරුවරුන්ට සහ දෙමාපියන්ට සිසු දරුවන් ස්වභාවික පරිසර අත්දැකීම් වලට යොමු කරවීම හා එතුලින් ඉගැන්වීමට අවස්ථාව සලසා දීම අභියෝගාත්මක කරුණක් බවට පත්වී ඇත. එබැවින්, රටේ අනාගත පරපුර වන දරුවන්, දේශීයත්වය අගය කරන, සොබාවික පරිසරයට ආදරය සහ ගෞරවය දක්වන වගකිවයුතු පුරවැසියන් බවට කුඩාවියේ සිටම හුරුකරවීම සිදුකළ යුතුව ඇත. එබැවින් මෙම ළමා පරිසරවේදියා වැඩසටහන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික විද්‍යා පදනම මඟින් වාර්ෂිකව පළමු ශ්‍රේණියේ සිට හය වන ශ්‍රේණිය දක්වා දරුවන් වෙනුවෙන් සංවිධානය කරනු ලබයි.

### 2. වැඩසටහන සඳහා දරුවන් යොමු කළ යුතු ආකාරය

මෙම වැඩසටහනේ මූලික සංකල්පය වන්නේ දරුවෙකුට තමා ජීවත් වන පරිසරයේ හෝ පාසල් අවට පරිසරයේ යම්කිසි තෝරාගත් පරිසර සාධකයක්/ ජීවියෙක් ශාකයක් පිළිබඳව සති 6ක කාලයක් නියමිත කාල රාමුවක් තුළ නිරීක්ෂණය කර වාර්තා කර ගැනීම සහ තමාගේ නිරීක්ෂණ ආශ්‍රිතව පරිසර දින පොතක් (natural journal) පිළියෙල කිරීමයි. මේ සඳහා සති 8ක කාලයක් ලබා දෙනු ලැබේ.

### 3. පරිසර අධ්‍යනයට යොදාගත හැකි ව්‍යාපෘති සඳහා - උදාහරණ කිහිපයක්

1. දරුවන්ට තම ගෙවත්තට පැමිණෙන කුරුල්ලන් නිරීක්ෂණය කළ හැක. **එක් විශේෂයක් පමණක්** තෝරාගෙන ඔවුන්ගේ හැසිරීම, ආහාර සොයා යාමේ පුරුදු (උදා: පොළොව මත ඇති ආහාර සොයාගැනීම, දඩයම් කර ආහාර සොයා ගැනීම ආදිය ), ආහාර සොයාගැනීම සඳහා ඔවුන්ගේ ශරීරය හැඩගැසී ඇති ආකාරය (උදා: හොටය, පාදය, බෙල්ල ආදී ) රංචු ගැසීම (රැළක්, යුගලක් හෝ හුදෙකලාව ජීවත්වීම) ආදිය නිරීක්ෂණය කර වාර්තා කිරීම සිදු කළ හැක.

මෙම සතුන්ගෙන් පරිසරයට ඇති ප්‍රයෝජන හෝ හානි සොයා බැලීමට ද දරුවාට මග පෙන්වන්න

2. දරුවාට ගෙවත්තේ ඇති කෘමීන් වර්ගයක් තෝරා ගෙන (උදා කුහුඹුවන්, මකුළුවන්, කුරුමිණියන්, සමනලුන් ආදිය) නිරීක්ෂණය කිරීමට යම් කාලයක් ලබා දෙන්න. එමෙන්ම අත් කාචයක් භාවිතයෙන් සමීපව නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. සතුරන්ගෙන් ආරක්ෂා වීමට ස්වභාවිකව ඔවුන් සකස් වී ඇති ආකාරය (සලබයන්, කෘමීන් පරිසරය සමඟ ජීවත් වීමට දක්වන අනුවර්තන) වාසස්ථාන සැකසීමට කටයුතු කරන ආකාරය (කුහුඹු ජනපදය) නිරීක්ෂණය කිරීමට යොමු කිරීම, පරිසරය හා දක්වන අනුවර්තන, වර්ණ රටා ආදිය නිරීක්ෂණය කර වාර්තා කර ගැනීමට යොමු කරන්න. මෙහිදී එක් සත්ව විශේෂයක් නිරීක්ෂණය සඳහා යොදා ගැනීම වඩා පුළුල් අධ්‍යයනයකට මග පාදයි.

3. ගෙවත්තට එන සතුන් (උදා: ලේනුන්, කටුස්සන්, වඳුරන්, මුගටියා ආදී සතුන්) නිරීක්ෂණය කර ඔවුන්ගේ ආහාර ගැනීමේ පුරුදු, පෙනුම, ඔවුන් ආහාර සොයන ආකාරය ආදිය නිරීක්ෂණය කිරීමට දරුවන් යොමු කරන්න. මෙහිදී මෙවැනි එක් සතෙකුගේ හැසිරීම් රටාව නිරීක්ෂණය කිරීම සෑහේ. තෝරාගත් සතාගේ වර්ගය, විශේෂය ,පිළිබඳව පොත පත ආශ්‍රිතව සොයා බලා අධ්‍යයනය කිරීමට දරුවාට උපකාර කරන්න. මොවුන්ගෙන් පරිසරයට ලැබෙන ප්‍රයෝජන වගා හානි පිලිබඳව අධ්‍යයනයට දරුවා යොමු කරන්න.

4. ඔබ කුරුළු ලැල්ලක් නිරීක්ෂණය කරන්නේ නම් විශේෂයෙන්ම එයට පිවිසෙන එක් පක්ෂි විශේෂයක් මත අවධානය යොමු කරමින්, ඔවුන්ගේ හැසිරීම් රටා සහ අනෙකුත් පක්ෂීන් සමඟ ඇතිවන අන්තර්ක්‍රියාවන් නිරීක්ෂණය කරන්න. එසේම එම පක්ෂියගේ හැසිරීම්, ආහාර ගැනීමේ රටා, විශේෂ ලක්ෂණ ආදිය නිරීක්ෂණය කරන්න.

## 4) <u>පහත සඳහන් ව්‍යාපෘති අනුමත කරනු නොලැබේ</u>

පහත සඳහන් නිරීක්ෂණ ව්‍යාපෘති ලෙස අනුමත කරනු නොලැබේ. එවැනි ව්‍යාපෘති තුලින් අවශ්‍ය පරිදි තොරතුරු ලබා ගත නොහැකි අතර ඒවා වැඩසටහනේ ප්‍රධාන අරමුණු වලට නොගැලපේ.

1. ගෘහස්ථ සත්ත්වයන්, සුරතල් සතුන් සහ ගොවිපල සත්ත්වයන්ගේ හැසිරීම් රටා
2. වර්ෂා කාලය තුළ අහසේ වලාකුළු රටා
3. පාසල් විෂය නිර්දේශයට ඇතුළත් වී ඇති නිරීක්ෂණ (උදාහරණ මුං, මෑ බීජ ප්‍රරෝහණය, සමනලයාගේ හා ගෙම්බාගේ ජීවන චක්‍රය)

## <u>5.නිරීක්ෂණ ක්‍රමවේදය</u>

1) දිනපතා සාර්ථකව සිදු කළ හැකි සහ සති හයක් (6 weeks) තිස්සේ ක්‍රමවත්ව කරගෙන යා හැකි ව්‍යාපෘතියක් තෝරාගන්න.
2) නිරීක්ෂණය දිනපතාම සිදු කළ යුතු අතර, එය ව්‍යාපෘති මුළු කාලසීමාව තුලම සිදු කළ යුතුය. මෙම නිරීක්ෂණ ජර්නලයේ (journal) පැහැදිලිව සටහන් කළ යුතුය. අමතරව,

නිරීක්ෂණ කාලය තුළ කාලගුණික තත්ත්වයද සටහන් කළ හැක. විශේෂ අවස්ථාවලදී, අමතර වෙලාවන්හිද නිරීක්ෂණ කළ හැක.

3) ඔබේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සඳහා රූපසටහන් භාවිතා කල හැකිය. එමඟින් ඔබේ නිරීක්ෂණය පැහැදිලිව ඉදිරිපත් කළ හැක.
4) ලිවීමට අපහසු දරුවන් චිත්‍ර සටහන් රූප භාවිතයෙන් වාර්තා ඉදිරිපත් කිරීමට යොමු කරන්න. යොදාගන්නා රූපසටහන් තුලින් අදාළ නිරීක්ෂණය පැහැදිලි විය යුතුය. 1 ශ්‍රේණියෙන් ඉහල දරුවන් නිරීක්ෂණය සටහන් කර එවීම අපේක්ෂිතය.
5) දරුවාට තමාගේ නිරීක්ෂණ රූප සටහන්, වියලන ලද මල් කොළ ආදී විවිධ ක්‍රම භාවිතා කරමින් නිදහසේ ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න.
6) දරුවාට අනන්‍ය වූ ආකාරයකට , ඔවුන්ගේ හැකියාව දක්ෂතා උපයෝගී කරගෙන පරිසර දින පොත නිර්මාණය කිරීම සඳහා උපරිම නිදහස සහ ඉඩ ලබාදෙන්න.
7) දරුවාගේ සිතුවිලි හෝ ප්‍රකාශනවලට බාධා නොකර හැකිතාක් නිවැරදිව භාෂාව, ව්‍යාකරණ, අකුරු භාවිතා කිරීමට උපකාර කරන්න.
8) අත්‍යවශ්‍යම තැන් වලදී පමණක් ඡායාරූප භාවිතා කිරීමට උපදෙස් දෙන්න දරුවාගේ නිර්මාණශීලීත්වයට සැමවිටම මුල්තැන දෙන්න. සඟරා, පොත්පත්, අන්තර්ජාලය ආදී ප්‍රභවයන් ඔස්සේ ලබාගත් පින්තූර දින පොත සකස් කිරීමට භාවිත නොකරන්න.
9) මාර්ගෝපදේශයක් සඳහා පමණක් ලබා දී ඇති පරිසර දින පොත් ආකෘතිය දරුවාගේ නිර්මාණශීලීත්වයට බාධාවක් නොවන ලෙස භාවිතා කිරීමට යොමු කරන්න. (ඇමුණුම III).
10) ජර්නලයේ පිටකවර නිර්මාණය දරුවාගේ නිර්මාණයක් විය යුතුය. මාතෘකා ආදිය දරුවා විසින් ලිවිය යුතුය.
11) ජාතික විද්‍යා පදනම මඟින් පරිසරය පිළිබඳ දේශන මාලාවක් 2025 අගෝස්තු මාසය තුල සංවිධානය කරනු ඇත. ජාතික විද්‍යා පදනමේ නිල YouTube නාලිකාව සහ නිල Facebook පිටුවට සම්බන්ධවීමෙන් මේ පිළිබඳ වැඩි දුර විස්තර ලබා ගත හැක (https://www.youtube.com/channel/UCWziS21LQ1L9xSDUZAKD5dw)

## 5.පරිසර දින පොත පිළියෙළ කිරිමේ දී සැලකිය යුතු කරුණු.

1. වාර්තා කිරීමේදී වැඩිහිටියන් විසින් භාවිතා කරන ඉහළ තාක්ෂණික, විද්‍යාත්මක යෙදුම් හෝ භාෂාව භාවිතා කිරීමට දරුවන් පෙලඹවීමෙන් වලකින්න. සරල වචන භාවිතා කර දිනපොත සැකසීමට දරුවන්ට ඉඩදෙන්න.
2. උපදෙස් පත්‍රිකාවේ දක්වා ඇති පරිදි පරිසර දින පොතේ පිටු එකතු කරන්න. ඇගැයීම සඳහා ලිහිල් පත්‍රිකා හෝ අක්‍රමවත් ලෙස එකතු කරන ලද පත්‍රිකා සලකා බලනු නොලැබේ.
3. මිල අධික කඩදාසි හෝ ලිපි ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් වළකින්න. පැහැදිලි කඩදාසි (සුදු හෝ වර්ණ) අවශ්‍ය පරිදි භාවිතා කරන්න ඉවතලන ද්‍රව්‍ය භාවිතා කර නිර්මාණ කිරීම උනන්දු වන්න.

## 6.වැඩසටහනට ලියාපදිංචි වීම

වැඩසටහනට සහභාගී වීමට කැමැත්තක් දක්වන දරුවන් ට පහත දක්වා ඇති පරිදි ගූගල් පෝරමය භාවිතා කර වැඩසටහන සඳහා ලියාපදිංචි විය හැකිය.

https://forms.gle/9eBpxXfe1C3RvcHdA

වැදගත් දිනයන්:

1. **වැඩසටහන සඳහා ලියාපදිංචි වීමේ අවසන් දිනය:** 2025 අගෝස්තු 29
2. **ව්‍යාපෘතිය ආරම්භ කිරීම:** 2025 අගෝස්තු 29
    - (නිරීක්ෂණය සඳහා සතියේ 6ක්, සහරාව සකස් කිරීමට සතියේ 2ක් ලබාදෙනු ලැබේ)
3. **සහරාව භාරදීමේ අවසන් දිනය:** 2025 ඔක්තෝබර් 31

## 7. පරිසර දින පොත ඉදිරිපත් කිරීම

දරුවන් විසින් සකස් කරන ලද පරිසර දින පොත 2025 ඔක්තෝබර් **31** වන දින හෝ ඊට පෙර ලිපියේ වම් පස ඉහල කෙළවර Kid Naturalist 2025 ලෙස දක්වා පහත ලිපිනයට යොමු කරන්න.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 7.

ඉදිරිපත් කරන ලද අදාළ පරිසර දින පොත, තරඟයේ ජයග්‍රාහකයින් ජාතික විද්‍යා පදනමේ නිල වෙබ් අඩවිය ඔස්සේ (www.nsf.gov.lk) ප්‍රකාශයට පත් කිරීමෙන් පසු මාසයක් ඇතුලත රජයේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට සවස ප.ව 4.00 දක්වා ජාතික විද්‍යා පදනම් පරිශ්‍රයේදී ලබා ගත හැක. එම කාලසීමාව තුළ භාර නොගත් සහරා විනාශ කරනු ලැබේ.

වැඩිදුර සඳහා අමතන්න
චමරිකා මහත්මිය /අංජලී මහත්මිය
Tel : 0112696771
Ext : 185